# “මගේ අරමුණ මේ දේශපාලන සංස්කෘතිය වෙනස් කිරීමයි”

එජනිපෙ කොළඹ දිස්ත්‍රික් අපේක්ෂක අමාත්‍ය **මිලින්ද මොරගොඩ**



වත්මන් මහ මැතිවරණය සම්බන්ධයෙන් කොළඹ දිස්ත්‍රික් එක්සත් ජනතා නිදහස් සන්ධාන අපේක්ෂක අමාත්‍ය මිලින්ද මොරගොඩ මහතා සමග රිවිර ඉරිදා සංග්‍රහය පැවැත් වූ සාකච්ඡාව මෙසේ පෙළගැසෙයි.

ප්‍ර : ඔබ මෙවර මැතිවරණයට ඉදිරිපත් වුණේ මොන අරමුණක් මුල් කරගෙන ද?

පි : ලංකාවේ දැන් තියෙන දේශපාලන පක්ෂ ක්‍රමය ගැනත් මගේ පැහැදීමක් නැහැ. මට අවශ්‍ය මේ දේශපාලන සංස්කෘතිය වෙනස් කරන්න. දැනට තිබෙන දේශපාලන සංස්කෘතිය නිසා මේ රට විනාශ මුඛයට යනවා. ඒ නිසයි දේශපාලන සංස්කෘතියේ වෙනසක් අවශ්‍ය වන්නේ. ඒ සඳහා වන ආකල්ප වෙනස ඇති කළ යුතුයි. එතැන දී පක්ෂ, පාට වගේ පටු සීමාවල රැඳිය යුතු නෑ. එම නිසා මම මැතිවරණයට ඉදිරිපත් වන්නේ මේ දේශපාලන සංස්කෘතිය වෙනස් කළ යුතුයි කියන පදනමින්.

ප්‍ර: ඔබ ඔහොම කිව්වට රටේ ජනතාව ඒක පිළිගන්නවද?

පි : රටේ ජනතාවගෙන් බහුතරයක් ඉන්නේ නිහඬවයි. සුළු පිරිසක් තමයි මේ දේශපාලන සංස්කෘතියට අනුවෙලා ඉන්නේ. අපට පුළුවන් මේ දේශපාලන සංස්කෘතියට අනුනොවී නිහඬව සිටින බහුතරය අවදි කරන්න පුළුවන් මැතිවරණ ව්‍යාපාරයක් දියත් කරන්නට. එය සාර්ථක වනු ඇති බවට විශ්වාසයක් මට තියෙනවා.

ප්‍ර : ඔබේ මැතිවරණ ව්‍යාපාරය දියත් කරන්නේ මොන විදියේ උපාය මාර්ගවලින් ද?

පි : මට අවශ්‍ය මුදල් නාස්ති නොවන මැතිවරණ ව්‍යාපාරයක් දියත් කරන්න. අපේ රටේ හුඟක් දේවල දී සල්ලි නාස්ති කරන්නේ අනවශ්‍ය දේවල් වෙනුවෙන්. උත්සවයක වුණත් වැඩිම මුදලක් වැය වන්නේ ප්‍රචාරය හෝ සැරසිලි වෙනුවෙන්. ඒ ක්‍රමය වෙනස් විය යුතුයි.

මම විශාල රැස්වීම් තියන්නේ නැහැ. මල් මාලා අනවශ්‍ය සැරසිලි වගේ දේවල්වලට මුදල් නාස්ති කරන්නේ නැහැ. මේ මැතිවරණය ක්‍රිකට් තරගයක් හෝ විනෝද මාර්ගයක් කර ගන්න මට වුවමනා කරන්නේ නැහැ. මේක ඊට වඩා ගැඹුරු දෙයක්. මෙතැන දී සාකච්ඡා කරන්න ඕන අපේ දරුවන්ගේ අනාගතය ගැනයි. ඒ වෙනුවෙන් ජනතාව අවදි කරන්නයි මම මැතිවරණ ව්‍යාපාරය කරගෙන යන්නේ. ගෙන්ගෙට ගිහින් ජනතාව දැනුවත් කිරීමටත් මම වැඩි තැනක් දෙනවා.

ප්‍ර : එක්සත් ජනතා නිදහස් සන්ධානයට රටේ ආර්ථික සංවර්ධනය ඇති කොට සමෘද්ධිය ඇති කරන්න පුළුවන්කමක් නැහැ කියලා විපක්ෂය චෝදනා කරනවා. ඒ පසුබිම යටතේ ඔබ නායකත්වය දරන ලංකා ජාතික සංගමය එක්සත් ජනතා නිදහස් සන්ධානයට සහයෝගය දෙන්න කල්පනා කළේ මොන පදනමින් ද?

පි : ජනාධිපතිතුමා යුද්ධය ජයග්‍රහණය කරන්න පුළුල් සන්ධානයක් හැදුවා. ඒ සන්ධානය තුළ විවිධ මතවාද තියෙන අය හිටියා. නමුත් ඔවුන් පොදු අරමුණක් වෙනුවෙන් කැප වුණා. යුද්ධය ජයග්‍රහණය කරා ගෙන යන්න ශක්තියක් වුණේ එයයි. රටේ ආර්ථික යුද්ධය ජය ගන්නත් එවැනිම සන්ධානයක් අවශ්‍යයි. ජනාධිපතිතුමා දැන් එයත් ගොඩනගා තිබෙනවා. අපි සහය දී තිබෙන්නේ එම සන්ධානයටයි. එතැන දී මගේ යෝජනා මම ඉදිරිපත් කරලා තියෙනවා. කොහොම වුණත් මම හිතන්නේ මේ පුළුල් සන්ධානයට රටේ ආර්ථික සංග්‍රාමය ජය ගන්නත් අවශ්‍ය ශක්තිය තිබෙනවයි කියලා.

ප්‍ර: නමුත් ප්‍රශ්නය තියෙන්නේ ප්‍රතිවිරුද්ධ මතධාරී කණ්ඩායම්වලට ආර්ථිකය සම්බන්ධ කරුණුවල දී එක තැනකට ඇවිල්ලා තීරණ ගන්න පුළුවන් වෙච්ද කියන එකයි...?

පි : මම හිතන්නේ ජනාධිපතිතුමාට මේ ආකාරයට ප්‍රතිවිරුද්ධ මතධාරී කණ්ඩායම් එක තැනකට ගෙන එන්න විශාල ශක්තියක් තියෙනවා. එතුමා කරන්න බැහැයි කියලා හුඟක් අය කියපු දේවල් කරපු කෙනෙක්. 2005 වසරේ දී ලංකාවේ විතරක් නෙවෙයි ලෝකේ කිසිම කෙනෙක් විශ්වාස කළේ නැහැ එල්ටීටීඊ සංවිධානය 2009 වසර වන විට සහමුලින්ම පරාජයට පත් වෙයි කියලා. නමුත් අද ඒ දේ සිද්ධ වෙලා තියෙනවා. මේ සන්ධානයට තියෙන ලොකුම ශක්තිය තමයි ඔය කියන විවිධ මත. ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් වන්නේ එවිටයි.

ප්‍ර : මෙවර මහ මැතිවරණයේ සන්ධානයට තුනෙන් දෙකක බලයක් හිමිවන බව එහි ඇතැම් නායකයන් අදහස් දක්වනවා. ඔබත් ඒ කතාව විශ්වාස කරනවාද?

පි : මෙහෙමයි. ඡන්දෙක දී තීරණ ගත යුත්තේ ජනතාව. අප කළ යුත්තේ අපේ ප්‍රතිපත්ති සහ වැඩපිළිවෙළ ජනතාවට ඉදිරිපත් කිරීමයි. ජනතාව ඒවා කියවා බලලා අධ්‍යයනය කරලා වඩාත් හොඳ වැඩපිළිවෙළට තමන්ගේ කැමැත්ත ලබා දෙයි. ඉතින් මම හිතන්නේ ඒක ජනතාවටම භාර දෙන එක වඩාත් හොඳයි. ජනතාව ලබා දෙන තීන්දුව දේශපාලනඥයන් වශයෙන් අප ලබා දෙන්න යෑම ඒ තරම් ගැළපෙන දෙයක් නෙවෙයි කියලයි මම පුද්ගලිකව විශ්වාස කරන්නේ.

2010 පාර්ලිමේන්තු මහ මැතිවරණය

ප්‍ර : මැතිවරණ ක්‍රමය වෙනස් කිරීම වැනි ආණ්ඩුවේ සටන් පාඨ ගැන ඔබට තියෙන්නේ මොන වගේ ආකල්පයක් ද?

පි : මම හිතන්නේ මේ පවතින මැතිවරණ ක්‍රමය නම් ලොකු විනාශයක් කියලා. කොට්ඨාස ක්‍රමය සහ අනුපාත ක්‍රමය මිශ්‍ර වුණු මැතිවරණ ක්‍රමයක් අපට ගැළපෙනවා. මෙතැන දී අප බලන්න ඕන පුද්ගලිකව හෝ පක්ෂ වශයෙන් අපට ලැබෙන වාසිය නෙවෙයි. රටට සිදුවන යහපතයි. ආණ්ඩු පක්ෂයේ හිටියත්, විපක්ෂයේ හිටියත් අප බලන්න ඕන එයයි. ඒ නිසා ලංකා ජාතික සංගමය මැතිවරණ ක්‍රමය වෙනස් වීම ගැන දරන්නේ ඔය ආකල්පය.

**රසික ජයකොඩි**